WWW.OLEVELAPI.COM

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019**

# 11 - බුද්ධ ධර්මය

## අවසාන ලකුණු ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| **I පත්‍රය** : | බහුවරණ ප්‍රශ්න 40 කි = | (1 x 40) | **ලකුණු 40 යි** |
| **II පත්‍රය** : | 1 වැනි ප්‍රශ්නය | කොටස් 10 කි කෙටි පිළිතුරු (2 x 10) | **ලකුණු 20 යි** |

2 වැනි ප්‍රශ්නය (2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

3 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

4 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

5 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

6 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

7 වැනි ප්‍රශ්නය — එක් කොටසකට ලකුණු 5 බැගින්
(ලකුණු 5 X 2 ) — ලකුණු 10 යි.

**ලකුණු 40 යි.**
**මුළු ලකුණු 100 යි.**

WWW.OLEVELAPI.COM

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | = 40 |
| II පත්‍රයට ලකුණු | = 60 |
| **මුළු ලකුණු** | = 100 |

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ලකුණු සටහන් කිරීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | .......................................................<br>.......................................................<br>....................................................... | √ | △ $\frac{4}{5}$ |
| (ii) | .......................................................<br>.......................................................<br>....................................................... | √ | △ $\frac{3}{5}$ |
| (iii) | .......................................................<br>.......................................................<br>....................................................... | √ | △ $\frac{3}{5}$ |

03 (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

WWW.OLEVELAPI.COM

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

WWW.OLEVELAPI.COM

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019**

# 11 - බුද්ධ ධර්මය

## සවිස්තර ලකුණු දීමේ පටිපාටිය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවේ දැක්වෙන පරිදි ජාතික අධ්‍යාපන පද්ධතිය මගින් ඉටුකරගත යුතු ජාතික පොදු අරමුණු 08 ක් වේ. එසේම මූලික නිපුණතා 07 ක් දැක්වේ. විධිමත් අධ්‍යාපනය මගින් මෙකී අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීම අපේක්ෂිතය. මූලික නිපුණතා අතර පස් වැන්න ආගම හා ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව වේ. එය පහත දැක්වේ.

5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව

"පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සාදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය."

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක සමස්ත විෂයමාලාව තුළින් පොදු අරමුණු හා මූලික නිපුණතා ඉටුකරගත යුතු අතර, ආගමික අධ්‍යාපනය තුළින් ඉහත දැක්වෙන පස්වන නිපුණතාව සුවිශේෂීව සපුරාගත යුතුව පවතී.

බුද්ධ ධර්මය විෂය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම වර්තමාන යුගයට අත්‍යවශ්‍යව පවතී. වනපොත්කරණයෙන් විෂය කරුණු හදාරා විභාග සමත්වීම එකම අරමුණ නොවිය යුතු අතර, ඉන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දීමටත් දහම් කරුණු භාවිතයට ගැනීමටත්, බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රේෂ්ඨ ධර්ම කරුණු අනුව තම ජීවිතය සාර්ථක කරගැනීමටත් සිසුන් යොමු කරලීම අත්‍යවශ්‍ය වේ. සමබර පෞරුෂයකින් හෙබි සැදැහැති බෞද්ධයකු දැයට දයාද කිරීම බුදු දහම ඉගැන්වීමේ මූලික අරමුණු විය යුතුය. බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරුවරයා මේ පිළිබඳ සුවිශේෂීව අවධානය යොමු කළ යුතුවේ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ සැකසුන විෂයමාලාවක් පාසල් පද්ධතියට ඉදිරිපත් කෙරිණි. ඒ අනුව බුද්ධ ධර්මය විෂයයේ අරමුණු 07 ක් දැක්වේ. මෙම අරමුණු සපුරාලන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකසා ගත යුතුවේ. එම විෂය අරමුණු මෙසේයි.

**විෂයයේ අරමුණු**

01. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදිව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

02. ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝගී කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

03. සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

04. ශ්‍රී ලාංකීය උරුමය දයාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

05. සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

06. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

07. බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

එසේම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් ද්විතීයික විෂය නිර්දේශය මූලික නිපුණතා 10 ක් යටතේ ගොනු කර ඇත. 6 ශ්‍රේණියේ සිට නිපුණතා මට්ටම් හා විෂය අන්තර්ගතය ක්‍රමයෙන් ගැඹුරින් හා පළලින් වැඩිවන ලෙස සර්පිලාකාර ක්‍රමයට ව්‍යාප්ත වන ලෙස සැකසී ඇත. බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා 10 පහත දැක්වේ.

**බුද්ධ ධර්මය විෂයයේ නිපුණතා**

01). තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.
02). ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක, ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.
03). බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
04). සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.
05). ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.
06). බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.
07). ජීවී, අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි.
08). ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.
09). බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි.
10). නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

ඉහත දැක්වූ විෂය අරමුණු 07 පෙරදැරි කරගෙන නිපුණතා 10 සම්පූර්ණ වන ලෙස විෂය ඉගැන්වීම සාර්ථකව සිදු කළේ නම් සිසුන් තුළ යහපත් ගුණවගාවන් සිදුවනු ඇත. මෙම අවශ්‍යතාවන් ඉටුවන ලෙස ප්‍රායෝගිකත්වයට නැඹුරුව තක්සේරුකරණය පාසල් පාදකව සිදුවිය යුතුය. අ.පො.ස. (සා.පෙළ) විභාගය යනු විෂය දැනුම පිළිබඳ සමාප්තික ඇගයීම වේ.

බුද්ධ ධර්මය විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම ප්‍රශ්න පත්‍ර සැකසී ඇත. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට සිසුන් යොමු කිරීම නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිතය. නිපුණතාවක් (Competency) යනු දැනුම (Knowledge) ආකල්ප (Attitude) කුසලතා (Skills) සහ යහ පුරුදු (Good Practices) යන මේවායේ සමස්ත එකතුවේ ප්‍රතිඵලය වෙයි. දිගුකාලීනව ලැබූ ඉගෙනුම් ක්‍රියාවලියේ අවසාන ඵලය නිපුණතාවන්ගෙන් පිරි සමබර පෞරුෂයෙන් යුතු යහපත් පුරවැසියන් වේ. බුද්ධ ධර්මය විෂයය න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව හැදෑරීම තුළින් ආගම විෂයයට අදාළ නිපුණතා ශිෂ්‍යයා සපුරා ගෙන ඇත යනු අපගේ විශ්වාසයයි. ඇගයීම් ක්‍රියාවලිය ද නිපුණතා පාදකව සිදුකරලීම සඳහා ප්‍රයත්න දරා ඇත. අදාළ නිපුණතාව ශිෂ්‍යයා අත් කර ගෙන තිබේද යන්න මැන බැලීමට උචිත අයුරින් බොහොමයක් වණු සැකසී ඇති බව සිහියේ තබාගත යුතුය.

මෙම විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. පළමුවැන්න බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. දෙවැන්න කෙටි පිළිතුරු සැපයීමේ හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්නවලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ලකුණු වෙන් කොට ඇත්තේ මතු දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| **I** | - පත්‍රය ලකුණු | 40 යි |
| **II** | - පත්‍රය ලකුණු | 60 යි |
| | **මුළු ලකුණු** | **100 යි** |

## බුද්ධ ධර්මය - I

01. අධ්‍යාපන ක්‍රියා පද්ධතිය මගින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් තුළ දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අභිමතාර්ථය වෙයි. හුදු දැනුම පමණක් යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියකු බිහි කිරීමට ප්‍රමාණවත් නොවේ. අංග සම්පූර්ණ පුරවැසියකු වීමට යහපත් ආකල්ප පෝෂණයක් ද තදනුබද්ධව සංවර්ධනය විය යුතු පුද්ගල කෞශල්‍යය ද අත්‍යාවශ්‍ය වෙයි. බුද්ධ ධර්මය විෂයය නිර්දේශය සැකසී ඇත්තේ දැනුම, අකල්ප හා කුසලතා වර්ධනය සඳහාය. ඒ සඳහා බුද්ධ ධර්මය පාඨග්‍රන්ථ මගින් විශාල ප්‍රයන්තයක් දරා ඇති අතර, ආකල්ප හා කුසලතා වර්ධනය විෂයය භාර ගුරු මහත්ම මහත්මීන්ගේ දායකත්වය මගින් පෝෂණය කිරීම අපේක්ෂිතය. බුද්ධ ධර්මය ආගමික විෂයය නිර්දේශයක් වුවද එමගින් හුදු දැනුම පමණක් මනිනු නොලැබේ. ප්‍රශ්න සැකසී ඇත්තේ දැනුම, ආකල්ප සහ කුසලතා විනිශ්චය කිරීම සඳහාය.

02. ප්‍රශ්න හතළිහකින් යුත් පළමුවැනි ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්ව ඇති කාලය පැයකි. ප්‍රශ්න පත්‍රයේ ම දැක්වෙන පිළිතුරු හතරකින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කිරීම විභාග අපේක්ෂකයා විසින් කළ යුතුය.

03. ප්‍රශ්නයට අදාළ පිළිතුර සේ පෙනෙන එහෙත් නිවැරදි පිළිතුරු නොවන පිළිතුරු තුනක් තිබේ. දී ඇති පිළිතුරු සටහනින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා බුද්ධ ධර්මය මැනවින් හදාරා තිබිය යුතුය.

04. අසා ඇති ප්‍රශ්න වහා අවබෝධකර ගැනීමේ ශක්තිය විභාග අපේක්ෂකයා සතු විය යුතුය. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම අසාර්ථක පිළිතුරක් සැපයීමට හේතු විය හැකිය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමෙන් පසු නොපමාව නිවැරදි පිළිතුර කුමක්දැයි හඳුනාගෙන ලකුණු කළ යුතුයි.

05. පැයක පමණ කෙටි කාලයක් තුළ මේ සියලු කාර්යයන් ඉටු කළ යුතුව ඇති බැවින් ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධ ඥානය හා කාර්යක්ෂමභාවය සාර්ථක පිළිතුරු සැපයීමට බෙහෙවින් උපකාරවත් වේ.

06. සරල ප්‍රශ්න හතළිහකින් යුත් මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ සාමාන්‍ය දැනීම පරීක්ෂාකර බැලීමය.

07. මේ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරුපත් ලකුණු කිරීමට පළමු පහත සඳහන් කරුණු කෙරෙහි පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය.

i. නිවැරදි වරණය තේරීමේ දී අපේක්ෂකයා ලකුණු කොට ඇත්තේ එක් වරණයක් පමණක් දැයි බලන්න. එක් වරණයකට වඩා වැඩි සංඛ්‍යාවක් ලකුණු කොට ඇත්නම් එම පිළිතුර ඉරක් ඇඳ කපා හරින්න.

ii. සිදුරුපත් භාවිත කරන පරීක්ෂකවරුන් ප්‍රශ්නයේ අංකයත්, නිවැරදි පිළිතුරත් පැහැදිලිව පෙනෙන සේ සිය සිදුරුපත සකස්කර ගත යුතුය.

iii. සිදුරුපත් මගින් හරි වැරදි ලකුණු කිරීමේ දී නිවැරදි වරණය සඳහන් කොටුව මත ලකුණු කිරීමෙන් වලකින්න. පිළිතුරට අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙහි හරි වැරදි ලකුණු කරන්න.

iv. නිවැරදි ලකුණු සංඛ්‍යාව ගණනය කොට අදාළ පේළිය යට මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

08. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයට අදාළ නිවැරදි උත්තර මතු දැක්වෙන සටහනෙහි පළවෙයි. නිවැරදි උත්තරයට එක් (01) ලකුණක් බැගින් හිමිවේ.

WWW.OLEVELAPI.COM

# බුද්ධ ධර්මය II

01. නව අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ විභාගය පැවැත්විණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව (Competency Based) ක්‍රියාකාරකම් පාදකව (Activity Based) සිදුවන අතරම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියද නිපුණතා පාදකව නිර්ණායක මූලිකව (Competency Based Criterion Reference Assessment and Evaluation) සිදුකිරීමට ප්‍රයත්න දරා ඇත. නිපුණතාවක් දැනුම ආකල්ප කුසලතා හා යහපුරුදුවලින් යුක්ත වෙයි. නිපුණතාවක් දිගුකාලීනව ඇතිවන්කි. ආගම හා සදාචාරයට අදාළ නිපුණතාවන් මෙන්ම බුද්ධ ධර්මය විෂයානුබද්ධ නිපුණතාවයන් ශිෂ්‍යයා ලබාගෙන තිබේද යන්න මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසී ඇත.

බුද්ධ ධර්මය විෂය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂකයා තුළ නිවැරදි අවබෝධය හා විෂය කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව ද, තමන් උගත් විෂය කරුණු ජීවිතය හා සමාජය සම්බන්ධ කොට විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් දක්වන නිපුණතා ද විමසා බැලීම මේ ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වෙයි.

02. බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයෙහි මතු දැක්වෙන උපදෙස් දී ඇත.

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට, කොටස්වලට ලකුණු ප්‍රදානය කිරීමේදී දිය යුතු ලකුණු ප්‍රමාණය මතකයෙහි තබා ගත යුතුය. පළමුවන ප්‍රශ්නයට ලකුණු (10 x 2) 20 කි. 02 සිට 06 දක්වා ප්‍රශ්නවල

i කොටසට ලකුණු 2 ක් ද, ii කොටසට ලකුණු 3 ක් ද, iii කොටසට ලකුණු 5 ක් ද වශයෙන් ලකුණු 10 බැගින් හිමිවේ. 7 වන ප්‍රශ්නයේ කොටසකට ලකුණු 05 බැගින් කොටස් දෙකට ලකුණු (5 x 2) 10 කි. ඒ අනුව II පත්‍රයට ලකුණු (20 + 10 x 4 ) 60 කි.

03. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බෞද්ධ චරිත කථා, බෞද්ධ ධර්මය, බෞද්ධ සමාජය, බෞද්ධාගමික චාරිත්‍ර, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය හා කලාශිල්ප, බෞද්ධ ශාසන ඉතිහාසය, ලක්දිව බුදුසසුන ආදිය පිළිබඳ විෂය නිර්දේශයට අදාළ කරුණු සම්බන්ධ සාමාන්‍ය ඥානය, විශේෂ ඥානය හා ප්‍රායෝගික අවබෝධය පරීක්ෂා කර බැලීම මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වනු ලැබේ.

දෙවන පත්‍රයේ අංක 1 ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ ධර්මය මූලික විෂය කරුණු කෙටියෙන් ලියා දැක්වීම සඳහා කෙටි ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නයක් ලෙසය. එහි දී ශිෂ්‍යයාහට නම් කිරීමක්, අර්ථ දැක්වීමක්, කෙටියෙන් හැඳින්වීමක් වැනි ප්‍රජානන හැකියා ලියා ඉදිරිපත් කිරීමට සිදුවේ. හිමි ලකුණු 20 කි. අංක 2 සිට 6 දක්වා ප්‍රශ්නවල i කොටසින් විෂයට අදාළ මූලික කරුණු පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂාවට ලක්කෙරෙයි. ii කොටසින් ඒ හා සම්බන්ධ කරුණු විග්‍රහ කොට ඇති අයුරු අපේක්ෂකයා මනාව වටහාගෙන ඇත්දැයි විමසුමට ලක්කෙරේ. iii කොටසින් අදාළ විෂය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ විචාරාත්මක අවබෝධය හා නිදහස් චින්තනය පරීක්ෂවට ලක් කරනු ලැබේ.

මෙම කොටස් තුනෙන් iii කොටසට සපයා ඇති පිළිතුරු බොහෝවිට ගැඹුරු නොවීමට පුළුවන. එහෙත් අසා ඇති ප්‍රශ්න නිවැරදිව වටහා ගෙන අර්ථවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් පිළිතුර කෙටි වුව ද සාධාරණ ලකුණු ප්‍රමාණයක් දීම සුදුසුය.

7 වන ප්‍රශ්නයේ මාතෘකා දෙකකට කෙටි සටහන් ලිවීම අපේක්ෂා කෙරේ.

04. ශිෂ්‍යයා නිවහල් චින්තනයට යොමු කිරීම නූතන අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය ලෙස සලකනු ලැබේ. එබැවින් බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී අදාළ පාඨ ග්‍රන්ථයන්හි අන්තර්ගතයට ම වහල් නොවී ස්වාධීනව ඉදිරිපත් කර ඇති නිවැරදි කරුණු පිළිබඳ ඔබේ අවධානය යොමු කිරීම මැනවි.

WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

2019.12.02 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුය :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සිදුහත් බෝසතාණන් වහන්සේ 'සත්‍ය ගවේසීව' සිටි සමයේ උන්වහන්සේට මුණ ගැසුණු අෂ්ඨ සමාපත්තිලාභීව සිටි තවුසාගේ නම කුමක් ද?

(1) භග්ගව (2) කාලදේවල
(3) ආලාරකාලාම (4) උද්දකරාමපුත්ත

**2.** "ආනන්දයෙනි, මේ රජගහනුවර සිත් අලවන සුලු ය. එසේම නිග්‍රෝධය සිත්කලු ය. චෞර ප්‍රපාතය සිත්කලු ය." යනාදී ප්‍රකාශය තුළින් කියැවෙන්නේ,

(1) වස් විසූ ස්ථාන පිළිබඳව ය.
(2) පාරිසරික සුන්දරත්වය ඇගයීමට ලක් කළ ස්ථාන පිළිබඳව ය.
(3) සක්මන් කිරීම සඳහා භාවිත කළ ස්ථාන පිළිබඳව ය.
(4) සරාගී බව වඩවන ස්ථාන පිළිබඳව ය.

**3.** මට්ටකුණ්ඩලී, රජ්ජුමාලා වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති,

(1) ගිලානෝපස්ථාන ගුණයයි. (2) අසරණ සරණ ගුණයයි.
(3) සහනශීලී ගුණයයි. (4) අකම්පය ගුණයයි.

**4.** බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය දැක උන්වහන්සේ අනුගමනය කිරීමට යොමු වූ භික්ෂුව කවුද?

(1) අනුරුද්ධ හිමි (2) ආනන්ද හිමි
(3) ධම්මාරාම හිමි (4) වක්කලී හිමි

**5.** "රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට" මෙම කවි දෙපදයෙන් කියැවෙන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති කිනම් බුදු ගුණය ද?

(1) සම්මා සම්බුද්ධ (2) අරහං
(3) ලෝකවිදූ (4) සුගත

**6.** නිවන් පසක් කිරීමට අවශ්‍ය වන මනා පිළිවෙත් රකින බැවින් සඟරුවන,

(1) සුපටිපන්න නම් වේ. (2) උජුපටිපන්න නම් වේ.
(3) ඤායපටිපන්න නම් වේ. (4) සාමීචිපටිපන්න නම් වේ.

7. "දානං සීලං පරිච්චාගං" යන ගාථාවෙහි සඳහන් ධර්ම කරුණු හඳුන්වන පොදු නාමය කුමක් ද?
(1) දස රාජ ධර්ම (2) දස පාරමිතා
(3) දස පුණ්‍යක්‍රියා (4) දස කුසල්

8. කිසියම් පුද්ගලයකු, වස්තුවක් හෝ සිද්ධියක් සමග විශේෂ ඇල්මක් හෝ පිළිකුලක් ඇති කර නොගෙන සමසිත පැවැත්වීම ප්‍රකට කෙරෙන්නේ,
(1) උපේක්ෂා පාරමිතාවෙනි. (2) මෛත්‍රී පාරමිතාවෙනි.
(3) ක්ෂාන්ති පාරමිතාවෙනි. (4) අධිෂ්ඨාන පාරමිතාවෙනි.

9. බුදුරජාණන් වහන්සේ ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනෙහි දී දේශනා කළ සූත්‍ර ධර්මය වන්නේ,
(1) අම්බට්ඨ සූත්‍රයයි. (2) මහා සීහනාද සූත්‍රයයි.
(3) වේදනා පරිග්‍රහ සූත්‍රයයි. (4) සෝණදණ්ඩ සූත්‍රයයි.

10. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම් අතරට අයත් **නොවන්නේ**,
(1) මැනවින් හික්මවීමයි. (2) මැනවින් ඉගැන්වීමයි.
(3) තම මිත්‍රයන්ට හඳුන්වා දීමයි. (4) පවින් වැළැක්වීමයි.

11. දැහැමින් උපයාගත් ධනය පරිභෝජනය කළ යුතු ආකාරය පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ 'පත්තකම්ම සූත්‍රය' දේශනා කළේ,
(1) උග්ග සිටුතුමාට ය. (2) අනේපිඬු සිටුතුමාට ය.
(3) කොසොල් රජතුමාට ය. (4) විශාඛා උපාසිකාවට ය.

12. පත්තකම්ම සූත්‍රයෙහි සඳහන් බලි සංකල්පයෙහි එන 'දේවතා බලි' යන්නෙහි අර්ථය වන්නේ,
(1) දෙවියන් උදෙසා සත්ත්ව බිලි පූජා පැවැත්වීම අනිවාර්ය බවයි.
(2) දෙවියකු විසින් සත්ත්වයා මැවූ බවයි.
(3) බිලි පූජා සඳහා දේවතාවකු යොදා ගත් බවයි.
(4) ආගමික කටයුතු සිදු කරමින් දෙවියන්ට පිං දීම සිදු කළ යුතු බවයි.

13. ගුරුවරුන්ට සවන්දීමෙන් පොතපත කියවීමෙන් නුවණ දියුණු කර ගැනීම ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) චින්තාමය ප්‍රඥා නමිනි. (2) සුතමය ප්‍රඥා නමිනි.
(3) භාවනාමය ප්‍රඥා නමිනි. (4) ඉන්ද්‍රියමය ප්‍රඥා නමිනි.

14. සංසාර නැමති සාගරය තරණය කිරීමට ඉවහල් වන, එසේම වැපිරිය යුතු බීජයක් ලෙස ද දක්වා ඇති, නිවන් මගට පිවිසීමට මුල්වන ධර්ම කරුණ වන්නේ,
(1) භක්තියයි. (2) සද්ධාවයි. (3) තපසයි. (4) ඔත්තප්පයයි.

15. තමා ලබන ආදායමට සරිලන ලෙස වියදම හොඳින් දැන අයවැය මනාව පාලනය කර ගැනීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන්නේ,
(1) උට්ඨාන සම්පදා ලෙස ය. (2) ආරක්ඛ සම්පදා ලෙස ය.
(3) කල්‍යාණමිත්තතා ලෙස ය. (4) සමජීවිකතා ලෙස ය.

16. නූපන් අකුසල් නූපදවීම, උපන් අකුසල් නැති කිරීම, නූපන් කුසල් ඉපදවීම, උපන් කුසල් වැඩිදියුණු කිරීම යන චතුර්විධ ක්‍රියාමාර්ගයන්හි යෙදීම ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි අන්තර්ගත වන්නේ කුමන මාර්ගාංගයට ද?
(1) සම්මා වාචා (2) සම්මා කම්මන්ත (3) සම්මා ආජීව (4) සම්මා වායාම

17. මංගල හා පරාභව සූත්‍රයන්හි සඳහන් ධර්මෝපදේශවලින් ප්‍රකට වන අර්ථය ඇතුළත් වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) සිතීමට හා විමසීමට අනුබල ලබා දෙයි.
(2) යුතුකම් ඉටු කළ යුතු සමාජ කණ්ඩායම් පෙන්වා දෙයි.
(3) නිවැරදි ධනෝපායන ක්‍රමෝපායයන් පිළිබඳ උගන්වයි.
(4) මෙලොව පරලොව දියුණුවට හා පරිහානියට ඉවහල් වන කරුණු ඉදිරිපත් කරයි.

**18.** බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයාට දේශනා කළ පරිදි යමෙක් දීර්ඝායුෂ්කව උපත ලැබීමට හේතු වන සාධකය වන්නේ,
(1) අන් සැපතට ඊර්ෂ්‍යා නොකිරීමයි. (2) ප්‍රාණඝාතයෙන් තොර වීමයි.
(3) ද්වේශ නොකිරීමයි. (4) මානයෙන් තොර වීමයි.

**19.** නිවන් මග ආවරණය කරන පංච නීවරණ ධර්ම අතර 'ව්‍යාපාදය' උපමා කොට ඇත්තේ,
(1) පාසි සහිත ජලයකට ය. (2) කැළඹී ගිය ජලයකට ය.
(3) බොර වී ගිය ජලයකට ය. (4) රත් වී උතුරන විට බුබුළු නැගෙන ජලයකට ය.

**20.** සිත කය දෙකෙහි නිතර පවතින නිදිමත හා උදාසීන ගතිය නීවරණ ධර්මයක් වන අතර, එය හැඳින්වෙන්නේ,
(1) කාමච්ඡන්ද නමිනි. (2) ථීනමිද්ධ නමිනි.
(3) උද්ධච්ච කුක්කුච්ච නමිනි. (4) විචිකිච්ඡා නමිනි.

**21.** භාවනාවට යොමු වන පුද්ගලයා විසින් හිඳීම, සිටීම, ඇවිදීම ආදී ඉරියව් පැවැත්වීම අවබෝධයෙන් සිදු කළ යුතු ය. එය ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) ඉන්ද්‍රිය සංවරය නමිනි. (2) සති සම්පජඤ්ඤය නමිනි.
(3) වේදනානුපස්සනා නමිනි. (4) කායානුපස්සනා නමිනි.

**22.** සමථ භාවනාව වැඩීමෙන් ලෞකික ජීවිතයට ලැබිය හැකි ප්‍රයෝජන ගණයට අයත් **නොවන** කරුණ කුමක් ද?
(1) ලෝභාදී කෙලෙස් සිතිවිලි පාලනය වීම
(2) අසහනය නැති වී ප්‍රසන්න පෙනුමක් ඇති වීම
(3) සිත විසිරයාමට නොදී එකඟ කර ගැනීමට උපකාරී වීම
(4) ත්‍රිලක්ෂණය පිළිබඳ මනා අවබෝධයක් ලැබිය හැකි වීම

**23.** "මම සම්බුද්ධ වෙමි, ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා ද වෙමි" යනුවෙන් බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ උන්වහන්සේ,
(1) කායික රෝගවලට ප්‍රතිකාර කළ බවයි.
(2) ශල්‍යකර්ම සිදු කළ බවයි.
(3) මානසික රෝග නිවාරණයට මග පෙන්වූ බවයි.
(4) උපස්ථායකයකු ලෙස කටයුතු කළ බවයි.

**24.** "මම තරුණවියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත." ආදී වශයෙන් පසුතැවීමට හේතුවන බව දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පද දෙක කුමක් ද?
(1) අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ
(2) තං ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
(3) අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනෙ ධනං
(4) සුජීවං අහිරිකේන - කාකසූරෙන ධංසිනා

**25.** පස්කම් සැපතින් නික්මීම, අනුන් නොනැසීම හා අනුන්ට හිංසා නොකිරීම යන සංකල්පනාවන්ගෙන් යුක්ත වීම,
(1) සම්මා දිට්ඨි නම් වේ. (2) සම්මා සංකප්ප නම් වේ.
(3) සම්මා කම්මන්ත නම් වේ. (4) සම්මා ආජීව නම් වේ.

**26.** "ප්‍රතිසන්ධි සිත හේතුකොට ගෙන පංචස්කන්ධය ඇති වේ." යන්න සඳහන් අනුලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නයි. (2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නයි.
(3) "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන්නයි. (4) "නාමරූප පච්චයා සළායතනං" යන්නයි.

**27.** මංගල සූත්‍රයෙහි "අනවජ්ජානි කම්මානි" යන පාඨයෙන් කියැවෙන නිවැරදි කර්මාන්ත ගණයට අයත් **නොවන්නේ**,
(1) කෘෂි කර්මාන්තයයි. (2) ගව පාලනයයි.
(3) සත්ත්ව වෙළඳාමයි. (4) රාජ්‍ය සේවයයි.

**28.** "දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං" යන ධම්මපද ගාථාවෙන් දැක්වෙන්නේ,
(1) සිතෙහි ස්වභාවයයි. (2) කයෙහි ස්වභාවයයි.
(3) සංස්කාර ධර්මවල ස්වභාවයයි. (4) රූප ධර්මවල ස්වභාවයයි.

**29.** "කාලාමයෙනි, මේ දහම සපුරා ගත්, සමාදන් කොටගත් තැනැත්තාට අවැඩ පිණිසම වන්නේ යැයි යම් කලෙක ඔබට වැටහේ නම් එකල්හි එය බැහැර කළ යුතු ය." මෙම ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ බුදු දහමේ එන,
(1) විමර්ශනශීලී බවයි. (2) සත්‍යගරුක බවයි.
(3) ප්‍රතිපත්තිගරුක බවයි. (4) උපායශීලී බවයි.

**30.** දස අකුසල කර්මවල මනෝ කර්ම ගණයට ගැනෙන අකුසල් ඇතුළත් වරණය කුමක් ද?
(1) ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර
(2) ප්‍රාණඝාත, අදත්තාදාන, මුසාවාද
(3) පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාපා
(4) අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි

**31.** "මොලොක් සහ තෙත් ගතියෙන් යුතුව ජනතා ගැටලුවලට විසඳුම් ලබා දීම" දසරාජධර්මවල හැඳින්වෙන්නේ,
(1) සීලය නමිනි. (2) ඍජු බව නමිනි. (3) මෘදු බව නමිනි. (4) තපස නමිනි.

**32.** "කියනුව දිවාරය - කෙරෙම් බුදුගුණ අලංකාරය" යනුවෙන් වර්ණනා කාව්‍ය ග්‍රන්ථයක් රචනා කළ කතුවරයා,
(1) තොටගමුවේ රාහුල හිමි ය. (2) වීදාගම මෛත්‍රේය හිමි ය.
(3) මයුරපාද පිරිවෙන්පති හිමි ය. (4) වැලිවිට සරණංකර හිමි ය.

**33.** දෙවන හා තෙවන ථේරවාදී ධර්ම සංගායනා සඳහා අනුග්‍රාහක දායකත්වය ලබා දුන් පාලකයින් දෙදෙනා,
(1) ධර්මාශෝක සහ අජාසත්ත ය. (2) අජාසත්ත සහ කාලාශෝක ය.
(3) කාලාශෝක සහ කණිෂ්ක ය. (4) කාලාශෝක සහ ධර්මාශෝක ය.

**34.** විභාෂා නමින් අටුවා ග්‍රන්ථ සම්පාදනය කොට, තඹ පත්තිරුවල ලියවා, සෙල්මුවා මඤ්ජුසාවල බහා ස්තූපයක තැන්පත් කරන ලද්දේ,
(1) දෙවන ධර්ම සංගායනාවේ දී ය. (2) තෙවන ධර්ම සංගායනාවේ දී ය.
(3) අලුවිහාර සංගායනාවේ දී ය. (4) කණිෂ්ක සංගායනාවේ දී ය.

**35.** "සිංහලයිනි නැගිටිව්, බුද්ධගයාව බේරා ගනිව්" යන ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ අනගාරික ධර්මපාලතුමා සතුව පැවති,
(1) නිහතමානී බවයි. (2) නිර්භීත බවයි.
(3) අවිහිංසාවාදී බවයි. (4) ප්‍රතිපත්තිගරුක බවයි.

**36.** බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කිරීම චිත්‍රයට නගා ඇති පොළොන්නරු යුගයට අයත් පූජනීය ස්ථානය කුමක් ද?
(1) හිඳගල විහාරය (2) දිඹුලාගල ලෙන් විහාරය
(3) තිවංක පිළිම ගෙය (4) මැදවල විහාරය

**37.** ශ්‍රී ලාංකික කලාකරුවාගේ කලා කුසලතාව මෙන් ම ධර්ම සන්නිවේදන ශක්‍යතාව ද ප්‍රකට කෙරෙන අග්‍රගණ්‍ය කලා නිර්මාණයක් වන්නේ,
(1) පටිමාඝරයයි. (2) චේතියඝරයයි.
(3) බෝධිඝරයයි. (4) සඳකඩපහණයි.

**38.** බහුජාතික සහ බහුආගමික සමාජයක් තුළ අන්‍ය ආගම්වලට ද ගරු කරමින් ස්වකීය අනන්‍යතාව තහවුරු වන පරිදි ජීවත් වීම,
(1) ජාත්‍යාලය නම් වේ. (2) සමානාත්මතාව නම් වේ.
(3) සහජීවනය නම් වේ. (4) සමජීවිකතාව නම් වේ.

**39.** ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස්දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන අතර, එයින් අනුභව කළ ආහාර වමාරා නැවත ආහාර ගන්නා තැනැත්තා,
(1) ආහාර හත්ථක නම් වේ. (2) අලංසාටක නම් වේ.
(3) තත්ථාවට්ටක නම් වේ. (4) භුත්තවමිතක නම් වේ.

**40.** පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,
(1) කාම තණ්හාවයි. (2) භව තණ්හාවයි.
(3) විභව තණ්හාවයි. (4) රස තණ්හාවයි.

* *

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

විෂයය අංකය / பாட இலக்கம்: 11
විෂයය / பாடம்: බුද්ධ ධර්මය

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 2 | 31. | 3 |
| 02. | 2 | 12. | 4 | 22. | 4 | 32. | 2 |
| 03. | 2 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 04. | 4 | 14. | 2 | 24. | 3 | 34. | 4 |
| 05. | 2 | 15. | 4 | 25. | 2 | 35. | 2 |
| 06. | 1 | 16. | 4 | 26. | 3 | 36. | 3 |
| 07. | 1 | 17. | 4 | 27. | 3 | 37. | 4 |
| 08. | 1 | 18. | 2 | 28. | 1 | 38. | 3 |
| 09. | 3 | 19. | 4 | 29. | 1 | 39. | 4 |
| 10. | 4 | 20. | 2 | 30. | 4 | 40. | 3 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25/40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25/40

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## II පත්‍රය - පිළිතුරු

1. (i) අංගුලිමාල දමනයෙන් ප්‍රකට වන බුද්ධ ගුණය ලියා දක්වන්න.
(ii) බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** නම් කරන්න.
(iii) 'අනවජ්ජ සුඛය' යන්න කෙටියෙන් අර්ථ දක්වන්න.
(iv) බුද්ධ චරිතයෙන් 'තාදී ගුණය' ප්‍රකට වන අවස්ථා **දෙකක්** ලියන්න.
(v) "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතො ආහ" මෙම පාඨයේ අදහස ලියන්න.
(vi) සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.
(vii) කුරුණෑගල සාහිත්‍ය යුගයට අයත් බෞද්ධ සාහිත්‍ය කෘති **දෙකක්** නම් කරන්න.
(viii) 'පුස්තකාරූඪ සංගීතියෙහි' ප්‍රතිඵල **දෙකක්** සඳහන් කරන්න.
(ix) අනුරාධපුර යුගයට අයත් අභයගිරි හා ජේතවන ස්තූප ඉදිකළ පාලකයින් **දෙදෙනාගේ** නම් ලියන්න.
(x) බුදුදහමේ උගන්වන සිත කිලිටි කරන අකුසල මූල **තුන** නම් කරන්න.

i පුරිසදම්ම සාරථී ගුණය/නොහික්මුණු පිරිස් හික්මවා ගැනීමේ ගුණය

**(ලකුණු** 02 **යි)**

ii සමථ භාවනා, විදර්ශනා භාවනා/සමථ භාවනා, විපස්සනා භාවනා/සමථ භාවනා, ත්‍රිලක්ෂණ භාවනා/සමාධි භාවනා, ප්‍රඥා භාවනා/චිත්ත භාවනා, පඤ්ඤා භාවනා

**(ලකුණු** 02 **යි)**

iii නිවැරදි දිවි පෙවෙතක් ගත කරමියි ඇතිවන සැපයයි/තුන්දොර හික්මවාගෙන කටයුතු කිරීමෙන් ඇති වන සැපය යි.

**(ලකුණු** 02 **යි)**

iv කොසොල් රජුගේ අසදෘශ මහ දානය පිළිගැනීම

බිම්බිසාර අනේපිඩු සිටුතුමා, විශාඛා වැනි ප්‍රභූවරු පිදූ සුවිසල් ආරාම මැදහත් සිතින් පිළිගැනීම.

වේරංජා නුවර වස් විසූ කාලයේ කටුක ආහාර වැළඳීම, සුප්පිය බ්‍රහ්මදත්ත පරිබ්‍රාජක යන්ගේ අපහාස හා ප්‍රශංසා මැදහත් සිතින් විඳදරාගැනීම.

සුන්දරී පරිබ්‍රාජිකාව, මාගන්දියා, චිංචාමානවිකාව වැනි අයගේ නින්දා අපහාස ඉවසීම

අක්කෝසභාරද්වාජ, කසීභාරද්වාජ වැනි බමුණන්ගේ දෝෂාරෝපණ ඉවසීම.

අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය ප්‍රකට වන ඕනෑම අවස්ථා දෙකක් දක්වා ඇත්නම් අදාළ කරුණකට ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.

**(ලකුණු** 02 **යි)**

v හේතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත් ද ඒ ධර්මයන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදාළ සේක./

යම් ධර්මයක් හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගනී ද එහි හේතුව ද තථාගතයන් වහන්සේ වදාළ සේක.

**(ලකුණු** 02 **යි)**

vi මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා/මෛත්‍රිය, කරුණාව,මුදිතාව,උපෙක්ෂාව

**(ලකුණු** 02 **යි)**

WWW.OLEVELAPI.COM

vii පන්සිය පණස් ජාතක පොත් වහන්සේ

සිංහල බෝධිවංශය
ථූපවංශය
අනාගතවංශය
දළදාසිරිත
උමංදාව
දළදා අස්න

**ග්‍රන්ථ දෙකක නම් සඳහන් වී ඇත්නම් ලකුණු 01 බැගින්** **(ලකුණු 02 යි)**

viii
- ත්‍රිපිටක ධර්මය තල්පත්වල ලිවීම/ග්‍රන්ථාරූඪ කිරීම
- ත්‍රිපිටක ධර්මයේ විකෘතිතා ඇති වීමේ ඉඩ ඇහිරීම
- නිකායාන්තර මතවාදයන්ගෙන් ථෙරවාදි බුදු දහමට එල්ලවන අභියෝග අවම කිරීම
- පසු කාලීනව ථෙරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල නැවත එය ස්ථාපිත කිරීමට හැකිවීම
- ත්‍රිපිටකය කටපාඩමින් ගෙන යාමේ දී සිදුවන අමතකවීම් මගහැරවීම

**(ලකුණු 02 යි)**

ix අභයගිරිය - වළගම්බා රජතුමා/වට්ට ගාමිණී අභය රජතුමා
ජේතවනය - මහසෙන් රජතුමා/මහාසේන රජතුමා

**(ලකුණු 02 යි)**

x ලෝභ
දෝස
මෝහ **(ලකුණු 02 යි)**

**2.** (i) දසපාරමිතාවලින් **දෙකක්** නම් කරන්න.
(ii) ඉහත (i) හි නම් කළ **එක්** පාරමිතාවක් පැහැදිලි කරන්න.
(iii) දැහැමි, මිත්‍රශීලී, බෝධිසත්ත්ව ආදර්ශ ඇති සමාජයක් බිහි කිරීමට පාරමිතා ධර්ම ඉවහල් වන ආකාරය පහදන්න.

i පාරමිතා ධර්ම

1. දාන පාරමිතාව (දාන පාරමිතා)
2. ශීල පාරමිතාව (සීල පාරමිතා)
3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව (නෙක්ඛම්ම පාරමිතා)
4. ප්‍රඥා පාරමිතව (පඤ්ඤා පරමිතා)
5. වීර්ය පාරමිතාව (වීරිය පාරමිතා)
6. ක්ෂාන්ති පාරමිතාව (ඛන්ති පාරමිතා)
7. සත්‍ය පාරමිතාව (සච්ච පාරමිතා)
8. අධිෂ්ඨාන පාරමිතාව (අධිට්ඨාන පාරමිතා)
9. මෛත්‍රී පාරමිතාව (මෙත්තා පාරමිතා)
10. උපේක්ෂා පාරමිතාව (උපෙක්ඛා පාරමිතා)

**මෙම පාරමිතා ධර්ම අතුරින් දෙකක් නම්කර තිබේ නම් ලකුණු දෙකක් ලබා දෙන්න.**

**(ලකුණු 02 යි)**

ii • **දාන**

තමන් සතු දෙයක් පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් අන් අයට පරිත්‍යාග කිරීමයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් දෙන දානයයි.

නිදසුන් :- වෙස්සන්තර, සිවි, සස ජාතක කථා

• **සීල**

සීල යනු ප්‍රාණඝාතාදී අකුසලවලින් වැලකී කය වචන සංවර කර ගැනීමයි. මෙය පාරමිතාවක් වන්නේ තෘෂ්ණා මාන ආදියෙන් තොරව නිවන් ආපේක්ෂාවෙන් සම්පූර්ණ කරන බැවිනි.

නිදසුන් :- සීල විමංස ජාතකය

• **නෙක්ඛම්ම**

පස්කම් සැප හැරදමා ගිහි ගෙයින් නික්ම යාම නෙක්ඛම්ම නම් වේ.

නිදසුන් :- මඛාදේව ජාතකය

• **පඤ්ඤා**

නිර්වාණාපේක්ෂාවෙන් පඤ්චස්කන්ධය යථා තත්වයෙන් දැකීමයි. එසේම ලෞකික ජීවිතයේ දී ද නුවණ මෙහෙයවා කටයුතු කිරීමයි.

නිදසුන් :- උම්මග්ග ජාතකය

• **වීරිය**

තමන්ගේත් අන් අයගේත් අභිවෘද්ධිය සඳහා ගන්නා නොපසුබට උත්සාහයයි.

නිදසුන් :- වණ්ණුපථ ජාතකය

• **ඛන්ති**

කරුණා හා උපාය දන්නා නුවණින් යුතු ඉවසීමේ ගුණයයි.

නිදසුන් :- ක්‍ෂාන්තිවාදී ජාතකය

WWW.OLEVELAPI.COM

• **සත්‍ය**

කරුණාවෙන් හා උපාය කුසලතාවෙන් යුතුව මුසාවාදයෙන් වැළකීමත්, සත්‍යයෙහි පිහිටීමත් සත්‍ය පාරමිතාවයි.

නිදසුන් :- වට්ටක ජාතකය

• **අධිට්ඨාන**

කරුණාවෙන් හා උපාය කුසලතාවෙන් යුතුව ස්ථිරවම සිතාගෙන එය කඩ නොකොට අධිෂ්ඨාන ශක්තියෙන් යුතුව කටයුතු කිරීමයි.

නිදසුන් :- තේමිය ජාතකය

• **මෙත්තා**

මෛත්‍රිය නම් ඔවුනොවුන් කෙරෙහි මිත්‍රශීලි බව හෝ සුහද බවයි. සියලු සතුන් කෙරෙහි සමසිත් පැතිරවීමයි.

නිදසුන් :- මහා කපි, මඝ මානවක ජාතක

- **උපේක්ඛා**

  හිතවත් අහිතවත් සියල්ලන් කෙරෙහි ඇලීම් ගැටීම් දෙකෙන් තොරව සමීපව පැවැත්මයි. එනම් මධ්‍යස්ථ බවයි.

  නිදසුන් :- ලෝමහංස ජාතකය

  **කෙටි පැහැදිලි කිරීමක් වේනම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.**

  **(ලකුණු 03 යි)**

iii පාරමිතා ධර්ම යනු බුද්ධත්වය ප්‍රාර්ථනා කරන උතුමන් විසින් පූරණය කරනු ලබන ගුණසමුදායකි.

දානාදී මෙම ගුණධර්ම පුහුණු කිරිමෙන් බුදු පසේ බුදු මහරහත් තත්වයන්ට පත්වීමට ඉවහල් වන්නාක් මෙන්ම දැහැමි මිත්‍රශීලී සමාජයක් බිහිකර ගැනීමටද ඉවහල් වේ. ලෝභ, ද්වේශ, මෝහයෙන් තොරව කුසල සිතිවිලි වර්ධනය කර ගැනීමට දානය උපකාරී වේ. නොකළ යුතු අවැඩදායක අයහපත් ක්‍රියාවලින් වැලකීම, වැඩදායක යහපත් ක්‍රියාවල නිරතවීම, සියලු සත්වයින්ට හිතෛෂි වීම. කරුණා මෛත්‍රිය දැක්වීම, සානුකම්පිත වීම, සත්‍යවාදී බව, ඉවසීම වැනි ගුණාංග මගින් දැහැමි මිත්‍රශීලී සමාජයක් ඇතිවේ. මේ අයුරින් දස පාරමිතා ගුණධර්ම පුහුණු කිරිම දැහැමි මිත්‍රශීලී බෝධිසත්ව ආදර්ශ ඇති සාමාජයක් බිහි කිරීමට ඉවහල් වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න**

**(ලකුණු 05 යි)**

**3.** (i) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදයෙන් ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න.

WWW.OLEVELAPI.COM

i අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤොමඤ්ඤො විසෝධයේ

**ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු 02 ප්‍රදානය කරන්න. අක්ෂර වින්‍යාසය නොසලකන්න**

**(ලකුණු 02 යි)**

ii • යමෙකු පවු කළොත් එයින් ඔහුම කෙලෙසෙන්නේය.
යමෙකු පව් නොකළොත් එයින් ඔහුම පිරිසිදු වන්නේ ය.
පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම ය.
එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය./

• තමා විසින් කරන ලද පවෙන් තමා අපිරිසිදු බවට පත්වේ.
තමා විසින් නොකරන ලද පවෙන් තමා පිරිසිදු බවට පත්වේ.
පිරිසිදු අපිරිසිදුබව තමා විසින්ම දත යුතුය.
කෙනෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය./

• තමා කළ පවෙන් තමා අපිරිසිදු බවටත් තමා නොකළ පවෙන් තමා පිරිසිදු බවටත් පත්වේ.
පිරිසිදු අපිරිසිදු බව පවතින්නේ තමා වෙතමය. කෙනෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.

**ගාථාවේ සම්පූර්ණ අදහස තිබේනම් ලකුණු 03 දෙන්න.** **(ලකුණු 03 යි)**

iii • බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදය සියලු දෙනාට පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයකි.
• ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීමට ඇවැසි උපදෙස් සපයන, ප්‍රායෝගිකව අදාළ කරගත හැකි අගනා ග්‍රන්ථයක් ලෙස ධම්මපදය සඳහන් කළ හැකිය.
• ධම්මපද ගාථා ධර්මයන්හි ඇතුළත් උපදෙස් මගින් හරි වැරදි, හොඳ නරක, පින් පව් හඳුනා ගැනීමට මග පෙන්වයි
• සිතෙහි සන්සුන්බව ඇතිකර ගැනීම, මනා සිහියෙන් යුතුව කටයුතු කිරීම හා වීර්යවන්තව ක්‍රියා කොට ජීවිතය ජය ගැනීමට උපදෙස් ලබාදෙයි.
• සමාජගත ජීවිතයේදී ඇසුරු කළ යුතු හා නොකළ යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට මග පෙන්වයි.
• සහයෝගයෙන් හා සහජීවනයෙන් යුතුව චාම් සරල ජීවිතයක් ගත කිරීමට ඉතා වටිනා උපදෙස් ලබාදෙයි.
• ශිෂ්‍ය පෞරුෂය නිවැරදි ක්‍රියාකාරකම් වලින් ගොඩනගා ගැනීමට ඉතා වටිනා උපදෙස් සපයයි.
• සමස්තයක් ලෙස ධම්මපදයෙන් මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට මෙන්ම පරලොව ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් ලබාදේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න.**

**(ලකුණු 05 යි)**

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** (i) චතුරාර්ය සත්‍ය අතුරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත (i) හි නම් කරන ලද **එක්** කරුණක් පැහැදිලි කරන්න.

(iii) දෛනික ජීවිතයේ අප මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍ය අදාළ කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

i
1. දුක්ඛ ආර්ය සත්‍ය/දුක
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය/දුකට හේතුව
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය/දුක නැති කිරීම
4. දුක්ඛ නිරෝධ ගාමිනි පටිපදා ආර්ය සත්‍ය/දුක නැතිකිරීමේ මග

**දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යනුවෙන් ලියා තිබුණ ද ලකුණු දෙන්න.**
**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න**

**(ලකුණු 02 යි)**

ii
- දුක්ඛ ආර්ය සත්‍ය (දුක පිළිබඳ උතුම් සත්‍ය)
  ඉපදීම (ජාති), වයසට යාම (ජරා), ලෙඩවීම (ව්‍යාධි), මරණය, ප්‍රියන්ගේ වෙන්විම, අප්‍රියයන් හා එක්විම, කැමති දේ නොලැබීම දුකය. කෙටියෙන් කියතොත් පංච උපාදානස්කන්ධයම දුකය.

- දුක්ඛ සමුදය ආර්ය සත්‍ය (දුක හට ගැනීමට හේතුව පිළිබඳ උතුම් සත්‍යය)
  පුනර්භවය ඇති කරන, ඇල්ම හා සතුට සහිත වූ ඒ ඒ තැන සිත අලවන තෘෂ්ණාව (තණ්හාව) දුකට හේතුවයි. කාම භව විභව යන ත්‍රිවිධ තෘෂ්ණාවයි.
  සසර නැවත නැවත ඉපදීමට හේතුවන තෘෂ්ණාවයි.
- දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය (දුක නැති කිරීම පිළිබඳ උතුම් සත්‍යය) සසර දුක ඇති කරන එකී තෘෂ්ණාව ඉතිරි නොවන ලෙස නැති කිරීම, නොඇලීම හෙවත් විරාගය, නිරෝධය සියලු ආශාවන් අත්හැරීම, සියලු දෙයින් නිදහස් වීම, මිදීම, ආලය දුරු කිරීම දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි. සසර නැවත නැවත ඉපදීමට හේතුවන තෘෂ්ණාව සම්පූර්ණයෙන් නැති කර දැමීමයි.

WWW.OLEVELAPI.COM

- දුක්ඛ නිරෝධ ගාමිනි පටිපදා ආර්ය සත්‍යය (දුක නැති කිරීමේ මාර්ගය පිළිබඳ උතුම් සත්‍යය) දුකින් මිදීමේ මගයි, එනම් අංග අටකින් යුත් ආර්ය මාර්ගයයි. මධ්‍යම ප්‍රතිපදාවයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, යන මාර්ග අංග අටයි.

**මූලික ආර්ථය ඇතුළත් කෙටි පැහැදිලි කිරීමකට සම්පූර්ණ ලකුණු දෙන්න**

**(ලකුණු 03 යි)**

iii දෛනික ජීවිතයේ අප මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමේ මාර්ගයක් ලෙස චතුරාර්ය සත්‍ය ධර්මය අදාළ කර ගත හැකිය. අප මුහුණ දෙන ඕනෑම ගැටලුවක් සලකා බැලීමේ දී එම ගැටලුව, ඒ සඳහා බලපාන හේතුව, එම ගැටලුවට විසඳුම, ගැටලුව විසඳීමේ මාර්ගය යන කරුණු හතර චතුරාර්ය සත්‍ය ධර්ම න්‍යාය අනුව විග්‍රහ කළ හැකිය.

අප ඉදිරියේ ඇතිවන ගැටලු පළමුවෙන්ම හඳාරා තේරුම්ගත යුතුය. දෙවනුව මෙම ගැටලුවලට තුඩු දී ඇති හේතු මොනවාදැයි අනාවරණය කරගත යුතුය. තෙවනුව කළ යුත්තේ එම ගැටලු නිරාකරණය කර ගැනීමට විසඳුම කුමක් දැයි අවබෝධ කර ගැනීමයි. අවසානයේ දී එය විසඳීම සඳහා යොදාගත් මාර්ගයෙහි ගමන් කිරීමට උපදෙස් දෙයි. මෙසේ චතුරාර්ය සත්‍යය ධර්මය ගැටලු විසඳා ගැනීමේ මාර්ගයක් ලෙස ප්‍රායෝගික ජීවිතයේ දී ද අදාළ කර ගත හැකිය.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න**

**(ලකුණු 05 යි)**

**5.** (i) ඉරියව් අනුව බුද්ධ ප්‍රතිමා බෙදා දක්වන ප්‍රධාන වර්ග **තුන** නම් කරන්න.

(ii) ඉහත (i) හි නම් කළ **එක්** පිළිම වර්ගයක් පිළිබඳ ව නිදසුන් සපයමින් පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලාංකික කලා ශිල්පීන්ගේ කලා කෞශල්‍යය බුද්ධ ප්‍රතිමා කලාව තුළින් ප්‍රකට වන අයුරු පහදන්න.

i හිටි පිළිම

හිඳි පිළිම

ඔත් පිළිම (සැතපෙන පිළිම/පරිනිර්වාණ මඤ්චකය නිරූපිත පිළිම)

**එක කරුණකට ලකුණු එක බැගින් ලකුණු 02 යි**

**(ලකුණු 02 යි)**

ii **හිටි පිළිම**

සිටගෙන සිටින ඉරියව්වෙන් නෙලා ඇති පිළිම හිටි පිළිමයි. මේවා ආබද්ධ පිළිම (පිළිමයට පිටුපසින් ආධාරකයක් ඇතිව නෙලා ඇති පිළිම) හා අනාබද්ධ පිළිම (ආධාරකයක් නොමැතිව නෙලා ඇති පිළිම) ලෙස බෙදා දැක්වේ. අවුකන, රැස්වෙහෙර, පොළොන්නරුවේ ගල් විහාරයේ පිළිමය ආබද්ධ පිළිමයට නිදසුනකි. මාලිගාවිල පිළිමය අනාබද්ධ පිළිමයට නිදසුනකි.

WWW.OLEVELAPI.COM

**හිඳි පිළිම**

වාඩි වී සිටින ඉරියව්වෙන් නෙළා ඇති පිළිම හිඳි පිළිමයි. ලංකාවේ බොහෝ ප්‍රදේශ වලින් මෙම ඉරියව්වෙන් නෙළා ඇති පිළිම හමුවේ. අනුරාධපුර සමාධි ප්‍රතිමාව, තොළුවිල සමාධි ප්‍රතිමාව, පොළොන්නරුවේ ගල් විහාරයේ හිඳි පිළිමය ආදිය හිඳි පිළිම සඳහා නිදසුන්වේ.

**සැතපෙන පිළිම**

සැතපෙන ඉරියව්වෙන් හා පරිනිර්වාණ ඉරියව්වෙන් නෙළා ඇති පිළිම ඔත් පිළිම ලෙස සැලකේ. තන්තිරිමලේ හා පොළොන්නරුවේ ගල් විහාරයේ ඇති සැතපෙන පිළිම නිදසුන් වේ.

**කෙටි පැහැදිලි කිරීමක් වේ නම් ලකුණු තුන දෙන්න**

**(ලකුණු 03 යි)**

iii ශ්‍රී ලංකික කලා ශිල්පීන්ගේ කලා කෞශලයය බුද්ධ ප්‍රතිමා කලාව තුළින් මොනවට ප්‍රකට වේ. බුදුරජාණන් වහන්සේ තුළ වූ මහා කරුණාව මහා ප්‍රඥාව වැනි ආධ්‍යාත්මික සමාධි ගුණ පිළිබිඹුවන අයුරින් ප්‍රතිමා නිර්මාණය කොට ඇත.

කළුගල්, කිරිගරුඬ, ඇත්දළ, ලෝහ, දැව ආදී අමුද්‍රව්‍ය භාවිත කොට ඉතා සියුම් කැටයම් ද සහිතව කලාත්මකව බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට ඇත. විවිධ මුද්‍රා සහ ආසන සහිතව මේවා නිර්මාණය කොට තිබීම විශේෂත්වයකි.

අනුරාධපුරයේ සමාධි පිළිමය, අවුකන පිළිමය, පොළොන්නරු ගල්විහාරයේ පිළිම නිදසුන්වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලසා ලකුණු පිරිනමන්න**

**(ලකුණු 05 යි)**

**6.** (i) පළමුවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩු දුන් හේතු මොනවා ද?

(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය, අනුග්‍රහය ලබාදුන් රාජ්‍ය පාලකයා, මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ නම් කරන්න.

(iii) ධර්මය විනය දෙකෙහි සුරක්ෂිත බව ඇති කරලීමට පළමුවන ධර්ම සංගායනාවේ දී ගත් විධිමත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

. i

- ආසන්න හේතුව සුභද්‍ද භික්ෂුව විසින් කරන ලද ප්‍රකාශය.
- බුදුරදුන් ජීවමාන කාලයේදීම ධර්ම විනය වැරදි ලෙස තේරුම් ගත් භික්ෂූන්ගේ ක්‍රියාකලාපය.
- විසිරී තිබූ ධර්ම විනය එක්තැන් කොට සංග්‍රහ කිරීමේ අවශ්‍යතාව.
- ධර්ම විනය සුරක්ෂිත කොට කට පාඩමින් පවත්වාගෙන යාමට භාණක පරපුරකට පැවරීමේ අවශ්‍යතාව.

**කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න.**

WWW.OLEVELAPI.COM

**(ලකුණු 02 යි )**

ii සංගායනාව පැවැත්වූ ස්ථානය :- රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහා ද්වාරය අභියස/රජගහනුවර වේභාර පර්වතය පාමුල/රජගහනුවර සප්තපර්ණී ගුහා ද්වාරයේ/සප්ත පර්ණී ගුහා ද්වාරයේ/රජගහ නුවර

අනුග්‍රහය ලබා දුන් පාලකය :- අජාසත්ත රජතුමා/අජාසත් රජ/අජාත ශත්‍රැ රජ

මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ :- මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ/මහා කාශ්‍යප හිමි/මහ කසුප් හිමි

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු තුනයි**

**(ලකුණු 03 යි)**

iii • විසිර පැවති ධර්ම විනය ඒකරාශී කිරීම

• ධර්ම විනය කොටස් කර භාණක පරම්පරා වෙත පැවරීම.

1. දීඝ නිකාය - ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
2. මජ්ඣිම නිකාය - සැරියුත් තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
3. අංගුත්තර නිකාය - අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
4. සංයුක්ත නිකාය - මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ද
5. ඛුද්දක නිකාය - සියලුම භික්‍ෂුන් වහන්සේලාට ද පැවරිණි. මෙය පළමු සංගායනාවේ සුවිශේෂී තීරණයකි.

විනය පිටකය උපාලි තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට පැවරිණි.

• මාගේ ඇවෑමෙන් භික්ෂූන්ගේ එකඟතාවය මත කුඩා, අනුකුඩා ශික්ෂාපද වෙනස් කර ගත හැකි යැයි බුදුරදුන් අනුදැන තිබුණද එකී කුඩා අනු කුඩා ශික්‍ෂා පද නිර්ණය කිරීමේ ගැටලුව මත කුඩා ශික්‍ෂා පදයක් හෝ වෙනස් නොකිරීමට තීරණය කිරීම

**සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.**

**(ලකුණු 05 යි)**

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු මහ රජතුමා
(ii) උට්ඨාන සම්පදා
(iii) ත්‍රිලක්ෂණය
(iv) වටදාගෙය

WWW.OLEVELAPI.COM

i • **දුටුගැමුණු මහ රජතුමා**

දුටු ගැමුණු රජතුමා රුහුණු රජ පෙළපතට අයත් කාවන්තිස්ස රජුගේ සහ විහාර මහා දේවියගේ වැඩිමහල් පුත්‍රයාය. එතුමාගේ බාල සොහොයුරා තිස්ස කුමාරයාය.

" මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජසැප පිණිස නොවේ. " යන්න දුටුගැමුණු රජතුමාගේ ආදර්ශ පාඨය විය. මෙහි පරමාර්ථය වූයේ දශක කිහිපයක පටන් විනාශ මුඛයට යමින් පැවති රටේ ස්වාධීනත්වය ආරක්‍ෂා කර ගනිමින් විදේශීය පාලනයෙන් රට මුදාගෙන එක් සේසත් කිරීමයි .

එළාර නම් විදේශීය පාලකයාගෙන් රට මුදා ගෙන රට එක් සේසත් කිරීම මෙතුමා කළ විශේෂ කාර්යය විය. භික්ෂූන් වහන්සේලාගේ ආවවාද අනුශාසනා අනුව රට පාලනය කිරීම සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා රුවන්වැලි සෑය, මිරිසවැටිය, ලෝවාමහාපාය ඉදිකළේය. එසේම කෘෂිකර්මාන්තය දියුණු කිරීමද මෙතුමාගේ කැපී පෙනෙන කාර්යයක් විය.

**(පිළිතුරු සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න)**

**(ලකුණු 05 යි)**

ii **උට්ඨාන සම්පදා**

ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි උට්ඨාන සම්පදා ලෙස හඳුන්වා ඇත්තේ තමන් කරන කවර හෝ රැකියාවක් උත්සාහයෙන් (උට්ඨාන වීරියාධිගතා) දෑතේ මහන්සියෙන් (බාහාබල පරිචිතා) දහදිය හෙළා (සේදා වක්ඛිත්තා) ධාර්මිකව (ධම්මිකා), ධාර්මික ක්‍රියා අනුගමනයෙන් (ධම්ම ලද්දා) කටයුතු කළ යුතු බවයි.

කෘෂිකර්මය, වෙළදාම, ගව පාලනය, දුනු ශිල්පය, රාජ්‍ය සේවය, ශිල්ප කර්මාන්ත යනාදී ධාර්මික රැකියා 06 ක් අනුමත කර ඇත.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න**

**(ලකුණු 05 යි)**

iii **ත්‍රිලක්ෂණය**

අනිත්‍ය දුක්ඛ අනාත්ම යනු ත්‍රිලක්ෂණයයි. මෙය බුදු දහමේ මූලික ඉගැන්වීමකි. අනිත්‍ය යනු වෙනස්වීමයි ජීවී අජීවී සියලු සංස්කාර ධර්මයයන් වෙනස් වන සුළුය.

ලොව වෙනස් වන සියල්ලෙහිම ස්වභාවය දුක් සහිත බවයි ජාති ජරා ව්‍යාධි මරණ ආදිය දුකෙහි ස්වභාවයයි. සමස්තයක් ලෙස පංච උපාදානස්ඛන්ධයම දුක් සහිත බව බුදු දහමේ දැක්වේ.

WWW.OLEVELAPI.COM

අනිත්‍ය හා දුක්ඛ යන ලක්ෂණවලින් සමන්විත සෑම සංස්කාර ධර්මයක්ම මමය මාගේය යයි ආත්මකොට ගත නොහැකි බැවින් එය අනාත්ම ලක්ෂණය නම් වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න**

**(ලකුණු 05 යි)**

iv **වටදාගෙය**

වටදාගෙය යනු ස්තූපය සදහා ඉදි වූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය වේ. එය චෛතියඝර නමින් ද හඳුන්වයි. ස්තූපයේ ආරක්ෂාව සඳහා එය නිමවා ඇත. ථූපාරාමය, අම්බස්තල, ලංකාරාම ආදි කුඩා ප්‍රමාණයේ ස්තූප සදහා වටදාගෙය ඉදිකර තිබුණු බවට පුරාවිද්‍යාත්මක සාධක හමුවෙයි. පොළොන්නරුවේ හා මැදිරිගිරියේ වටදාගෙවල් කලාත්මක අතින් අග්‍රගන්‍ය නිර්මාණ ලෙස සැළකේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න**

**(ලකුණු 05 යි)**

සටහන් :-

WWW.OLEVELAPI.COM